රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:-- 302

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1985 ජුලි මස 26 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**විදේශ වලට පත්කරනු ලබන නිලධාරීන්ගේ කලත්‍රයන්ට වැටුප් රහිත නිවාඩු දීම.**

සේවයේ ස්ථිර කරන ලද රජයේ නිලධාරියෙකුට පිය කලත්‍රයා රාජකාරි සඳහා විදේශගතව සිටින විටකදී, ඔහු/ඇය හා එක්වීම සඳහා වැටුප් රහිත නිවාඩු දෙනු ලැබේ.

(අ) මෙම නිවාඩු, වැටුප් වර්ධක පිළිබඳ කාර්ය සඳහා ගණන් ගතයුතුවේ. ඔහු/ඇය ආපසු දිවයිනට පැමිණි විට ඔහු/ඇය එසේ විදේශයකට නොගියේ නම්, එළඹීමට හැකිව තිබුනාවූ වැටුප් පියවරෙහි තැබිය හැකිය. එතෙකුදු වුවත්, එසේ කලත්‍රයන්ගේ, සාමාන්‍යයෙන් ඔහුගේ/ඇයගේ වැටුප් වර්ධකය/වර්ධකයන් ගෙවීම සඳහා නුසුදුසු බවට පත් කරන, වැටුප් රහිත නිවාඩු කාලය තුළ වූ වැඩ හා හැසිරීම සම්බන්ධයෙන් අහිතකර වාර්තාවක්, සාමාන්‍යයෙන් ඔහුගේ/ඇයගේ වැටුප් වර්ධකය/වර්ධකයන් දෙන බලධාරියාට ඉදිරිපත් වී නැති වූ විට පමණක්ය.

(ආ) වැටුප් රහිත නිවාඩු මත සිටින කාලය තුළ ලබා ගන්නා වැටුප් වැඩිවීම් වෙනුවෙන් හිඟ වැටුප් නොගෙවිය යුතුය.

(ඇ) මෙම චක්‍රලේඛය ප්‍රකාර දෙන නිවාඩු, විශ්‍රාම වැටුප් සඳහා ගණන් ගත යුතු නොවේ.

(ඈ) එසේ නිවාඩු ලැබීමේ ප්‍රතිඵලයක් වශයෙන් පහත සඳහන් විධිවිධානයන්හි දැක්වෙන පරිදි හැර, නිලධාරියෙකුගේ ජ්‍යෙෂ්ඨත්වය සඳහා බලපාන්නේ නැත.

(i) මෙම චක්‍රලේඛය යටතේ වැටුප් රහිත නිවාඩු ලබා සිටින රජයේ නිලධාරියෙකු එකී වැටුප් රහිත නිවාඩු කාලය තුල ඇති වන්නාවූ කිසියම් පුරප්පාඩුවකට ඔහු/ඇය උසස් කිරීම සඳහා සලකා බැලිය යුතු නොවේ.

(ii) උසස් කිරීම සඳහා බඳවා ගැනීමේ පරිපාටියෙන් අවම සේවා කාලයක් නියම කෙරේ නම්, එකී අවම සේවා කාලය ගණන් ගැනීමේදී මෙම චක්‍රලේඛය යටතේ දෙනු ලබන වැටුප් රහිත නිවාඩු කාලය ගණන් නොගත යුතුවේ.

(ඉ) බඳවා ගැනීමේ පරිපාටියේ උසස් කිරීම සඳහා සලකා බැලීමට සුදුසුකමක් වශයෙන් යම් වැටුප් ලක්ෂ්‍යයකට එළඹීම නියම කර ඇති විට, මෙම චක්‍රලේඛයේ 1(අ) පරිච්ඡේදය යටතේ දෙන ලද නිසියම් වැටුප් වර්ධකය උසස් කිරීම සඳහා වැටුප් ලක්ෂ්‍යයකට තීරණය කිරීමේදී ගණන් නොගත යුතු

02. මෙම තීරණය මීට කලින් රාජ්‍ය සේවය සඳහා පිටරට සිටි සිය ස්වාමිපුරුෂයන්/භාර්යාවන් සමඟ එකතුවීම සඳහා වැටුප් රහිත නිවාඩු ලැබූ සියළු කලත්‍රයන් සම්බන්ධයෙන් බලපැවැත්වේ.

03. වැටුප් රහිත නිවාඩු අනුමත කිරීමේදී අදාළ වන ආයතන සංග්‍රහයේ සෙසු විධිවිධානයන් හි වෙනසක් නොකෙරේ.

Siriwardhana

ලේකම්,

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.